**අධ්‍යාපන අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය**

**(SLIATE)**

# ඇබෑර්තු

SLIATE ආයතනයේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. (http://www.sliate.ac.lk/app/forms/applications-to-recruit-lecturers/) මගින් මාර්ගගතව, යථාපරිදි සම්පූර්ණ කළ අයදුම්පත්, SLIATE ආයතනය වෙත, 2021-05-09 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. කරුණාකර, වඩා කැමති සේවා ස්ථානය (උපරිම 03) අයදුම්පතෙහි සඳහන් කරන්න. (ආයතනයේ සේවා අවශ්‍යතා මත, බඳවා ගැනීමේදී මෙම ස්ථාන වෙනස් කිරීමට අවකාශ ඇත.)

**01. සහකාර කථිකාචාර්ය - (ඇබෑර්තු 09)**

| | විෂය ක්ෂේත්‍රය | සේවා ස්ථානය |
|---|---|---|
| A | ඉංජිනේරු විද්‍යාව - සිවිල් (ඇබෑර්තු 05) | ගාල්ල - 02<br>කොළඹ - 03 |
| B | ඉංජිනේරු විද්‍යාව - ප්‍රමාණ සමීක්ෂණ (ඇබෑර්තු 01) | ගාල්ල - 01 |
| C | ඉංජිනේරු විද්‍යාව - විදුලිමය (ඇබෑර්තු 03) | ගාල්ල - 01<br>කොළඹ - 02 |
| D | ඉංජිනේරු විද්‍යාව - යාන්ත්‍රික (ඇබෑර්තු 02) | ගාල්ල - 02 |
| E | ව්‍යාපෘති කළමනාකරණ (ඇබෑර්තු 01) | කෑගල්ල - 01 |
| F | ඉංග්‍රීසි (ඇබෑර්තු 08) | නාවලපිටිය - 02<br>වව්නියාව - 01<br>මන්නාරම - 02<br>සමන්තුරේ - 01<br>රත්නපුර - 01<br>අනුරාධපුර - 01 |
| G | තොරතුරු තාක්ෂණ (ඇබෑර්තු 07) | වව්නියාව - 01<br>බදුල්ල - 01<br>මඩකලපුව - 01<br>රත්නපුර - 02<br>ත්‍රිකුණාමලය - 01<br>තංගල්ල - 01 |
| H | සංචාරක හා සත්කාරක සේවා කළමනාකරණ (ඇබෑර්තු 02) | මඩකලපුව - 01<br>ත්‍රිකුණාමලය - 01 |

**අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම් :**

1) ඉංජිනේරු විද්‍යාව - සිවිල් / ප්‍රමාණ සමීක්ෂණ / විදුලිමය / යාන්ත්‍රික

   1) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු විද්‍යා උපාධියක් හෝ සමාන සුදුසුකම්,

   සහ

2) ඉංග්‍රීසි භාෂාවෙන් දේශන පැවැත්වීමේ හැකියාව.

**2). ඉංග්‍රීසි / තොරතුරු තාක්ෂණ / ව්‍යාපෘති කළමනාකරණ / සංචාරක හා සත්කාරක සේවා කළමනාකරණ**

1) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත්, අදාළ විෂය ක්ෂේත්‍රයේ 1 වන පංතිය හෝ 2 වන පංතිය ඉහළ පෙළ උපාධියක්,

   හෝ

2) අදාළ විෂය ක්ෂේත්‍රයේ 2 වන පංතිය පහළ පෙළ උපාධියක් සමග අධ්‍යාපනික සුදුසුකම් ලැබීමෙන් පසුව, උසස් අධ්‍යාපන ආයතනයක වසර 2 ක පළපුරුද්ද හෝ පිළිගත් ක්ෂේත්‍රයක මධ්‍යම තලයේ කළමනාකරුවකු ලෙස කාර්මික පළපුරුද්ද,

   සහ

3). ඉංග්‍රීසි භාෂාවෙන් දේශන පැවැත්වීමේ හැකියාව.

වැටුප් පරිමාණය :

AR1-2016-53,150-10X1,375-15X1,910-9,5550/-

**සටහන :** එයට අමතරව, රජයේ අනුමත දීමනාද ගෙවනු ලැබේ.

**සේවා කොන්දේසි :**

1). තෝරාගත් අයදුම්කරුවන් විසින් තම ඉපැයීම්වලින් 10% ප්‍රමාණයකින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායක විය යුතු අතර, SLIATE ආයතනය විසින්, ඒ සඳහා, 15% ක දායකත්වයක් දරනු ඇත. එයට අමතරව, ආයතනය විසින් සේවකයාගේ වැටුපෙන් 3% දායකත්වයක් සේවක භාර අරමුදලටද (ETF) ලබා දෙනු ඇත.

2). සියලුම වර්ගීකරණයන් සඳහා වයස් සීමාව අවුරුදු 45 ට අඩුවිය යුතුය. කෙසේ වෙතත් රාජ්‍ය සේවයේ / රාජ්‍ය අංශයේ අයදුම්කරුවන්හට මෙම වයස් සීමා අදාළ නොවේ.

3). රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන්, තම අයදුම්පත්වල මුල් පිටපත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතු අතර, ආයතන ප්‍රධානී විසින් තම නිර්දේශ එහි සඳහන් කළ යුතුය.

4). රජයේ දෙපාර්තමේන්තුවල විශ්‍රාම වැටුප්ලාභී තනතුරු හොබවන්නන් විසින්, ආයතනික අධ්‍යක්ෂ ජනරාල් වෙතින් සේවයෙන් නිදහස් කර ගැනීම සිදු කරගත යුතුයි. කෙසේ වෙතත්, SLIATE ආයතනයේ සේවයේ යෙදෙන අතරතුර විශ්‍රාම වැටුපට හිමිකම නොලැබේ.

5). කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

6). සේවකයන් පත්වීම් ලබාදෙනු ලබන සේවා ස්ථානයේ සිට, එම පත්වීම ලද දිනයේ සිට වසර 06 ක් යන තෙක්, ස්ථාන මාරුවීම් සඳහා සුදුසුකම් නොලබති.

සහතිකවල සහතික කළ පිටපත් කට්ටල සහිත අයදුම්පත්වල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

අදාළ භාරගැනීම අවසන් කරනු ලබන දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත්, දැන්වීමකින් තොරවම ප්‍රතික්ෂේප කෙරේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය,**
**අංක 320, ටී.බී. ජයා මාවත, කොළඹ 10.**